# නිව් සවුත් වේල්සයෙහි සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුව

මව් බිමෙන් ඈත්ව, බහු වාර්ගික, බහු ආගමික පසුබිමක් ඇති, විවිධ උප සංස්කෘතීන් වලින් සමන්විත ඕස්ට්‍රේලියාව වැනි රටක ජීවත් වුවද, 'විවිධත්වය තුලින් ඒකියත්වය' සහ ඕස්ට්‍රේලියානු බහු සංස්කෘතික පදනම ගැන දැනුවත්ව, සිංහල සංස්කෘතික ගති පැවතුම් හා ස්වකීය උරුමයන් ප්‍රවර්ධනයට පෝෂණයට හා ප්‍රචලිත කිරීමට කටයුතු කිරීම මෙන්ම, ඒවා ආරක්‍ෂා කර, බාල පරපුරට උරුම කර දීමේ, පරම වූ අභිලාෂය පෙරදැරිව, මීට දශක දෙකකට පෙර සිංහල සංස්කෘතික හමුව ආරම්භ කර ඇත. නිව් සවුත් වේල්ස්හි සංස්ථාපිත සංවිධාන අතුරින් ප්‍රමුඛ පෙළේ ස්වේච්ඡා සංවිධානයක් ලෙස, මෙය විසි වසරක් තිස්සේ අප ප්‍රජාවට සිදුකර ඇති විශිෂ්ඨ සමාජ මෙහෙවර අනභිබවනීය වේ. හේදයකින් තොරව ශ්‍රී ලාංකික සම්භවයක් ඇති වෘත්තිකයන් මෙරටට පැමිණීමට පටන් ගෙන ඇත්තේ, 1973 හි ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීති ලිහිල් වීමත් සමඟය. එතැන් සිට සිංහල සම්භවයකින් යුත් පිරිසක් මෙම භූමියෙහි විසුවද, වත්මනෙහි මෙන් සිංහලකම හෝ සිංහල සංස්කෘතිය අගයන පරිසරයක් 1990 වන තුරුත් මෙහි ස්ථාපනය වී නොතිබිණ. මෙවැනි කාල වකවානුවකදී මෙහි විසූ, සිංහල සංස්කෘතික සාරධර්මයන්ට ගරුකරන, අපේ කම හා අපේ උරුමයට හිතැති වූ මෙන්ම, මෙරට උපදින අපේ දූ දරුවන්ට සිංහල සංස්කෘතියේ වටිනා දේ දායාද කිරීමට උනන්දු වූ පිරිසකගේ පුරෝගාමිත්වයෙන් 1990 වසරේදී, සිංහල සංස්කෘතික හමුව ආරම්භ කර ඇත.



සිංහල සංස්කෘතික හමුවේ සමාරම්භක නිලධාරී මණ්ඩලයෙන් ක්‍රෙස්ට්වුඩ් බාලදක්ෂිකා පියසෙහිදී පැවැත්වුණු සුහද හමුවට සහභාගී වූ නිලධාරී මහත්ම මහත්මීන් එහි ප්‍රථම සභාපති සෝමරත්න දිසානායක මහතා සමඟ



2010/2011 වසරෙහි නිලධාරී මණ්ඩලය

1990 වසරෙහි ජනවාරි 10 වැනිදා එපිං :ඤචචසබට* හි චන්ද්‍රා සන්දනායක යුවළගේ නිවසෙහිදී, සෝමරත්න දිසා-නායකයන් ගේ මූලිකත්වයෙන් පැවැත්වූ රැස්වීමෙහි තීරණයකට අනුව සිංහල සංස්කෘතික හමුව බිහි වීමේ වැදගත් මොහොත උදා වී ඇත්තේ, 1990 මාර්තු 25 වැනිදා, සිඩ්නි පුරවරයෙහි, වෙන්ට්වර්ත්විල්හි, ඝීබ ශාලාවේ දී වික්ටර් රත්නායක ශූරීන්ගේ -ස" ප්‍රසංගයත් සමඟය. ඉන් අනතුරුව 1990 මැයි මස 26 වන සෙනසුරාදා පැරමටා හී ශාන්ත ඇන්ඩෘ දේවස්ථාන ශාලාවේදී, 'සිංහල සංස්කෘතික හමුවේ' සමාරම්භක මංගල මහා සභා රැස්වීම පවත්වා ඇත.

සිංහල සංස්කෘතික හමුවේ ප්‍රථම නිළධාරී මණ්ඩලය
1990/1991 ආරම්භක වර්ෂය සඳහා තේරී පත් වූ ප්‍රථම නිලධාරී මණ්ඩලය මෙසේය. සභාපති ලෙස සෝමරත්න දිසානායක, උප සභාපතිවරුන් ලෙස වෛද්‍ය බණ්ඩාර සෙනෙවිරත්න හා එම්. එස්. පෙරේරා සමලේකම්වරුන් ලෙස චිත්‍රා සන්දනායක හා උබයසිරි විජයනන්ද වික්‍රම, භාණ්ඩාගාරික ලෙස වෛද්‍ය හෙරල්ඩ් ගුණතිලක, සංස්කාරක ලෙස කිත්සිරි කරුණාරත්න, භාෂාව හා සාහිත්‍යය උප කමිටු සාමාජිකයන් ලෙස පී.එම් ආරියරත්න, කමල් ඇල්ලෙපොළ, චන්ද්‍රා මල්ලවආරච්චි හා ආර්. පරණවිතාන, අධ්‍යාපන උප කමිටු සාමාජිකයන් ලෙස චන්ද්‍රා සන්දනායක, නිව්ටන් සමරකෝන්, පද්මිණී පීරිස් හා ජයන්ත අබේධීර, සංගීතය හා විනෝද, සමාජ කටයුතු උප කමිටුව ලෙස රන්ජනී ධම්මපාල, සුනිල් රණසිංහ, ටී.බී. ඉලංගසිංහ හා බොනිෆස් ප්‍රනාන්දු, නැටුම් හා ලලිත කලා උප කමිටුව ලෙස මාලා අබේවික්‍රම, මහී රත්නපාල, ලසන්ත පීරිස් හා ශාන්ති ලාල් කොරතොට, ජන සන්නිවේදනය මාධ්‍යය හා නාට්‍යය උප කමිටුව ලෙස සුදර්ශන රන්නප්පුලි, ප්‍රසන්න කාරියවසම්, ශාන්ති විමලරත්ත හා රේඛා සිරිමාන්න යන මහත්ම මහත්මීන්
තම කාලය, ශ්‍රමය හා ධනය වැය කරමින්, මෙවන් සංවිධානයක් සංස්ථාපිත කිරීමට පුරෝගාමී වූ ඒ සැමට පළමුව අපගේ කෘතවේදී ශීර්ෂ ප්‍රණාමය පුද කර සිටින්නෙමු.



ආරම්භක වර්ෂයෙහි සිට වත්මන දක්වා සිංහල සංස්කෘතික හමුවට තේරී පත් වී ඇති සභාපතිවරුන් අතුරෙන් ක්‍රෙස්ට්වුඩ් බාලදක්ෂිකා පියසෙහිදී පැවැත්වුණු සුහද හමුවට සහභාගී වූ සභාපතිවරුන් එහි ප්‍රථම සභාපති සෝමරත්න දිසානායක මහතා සමඟ

1990/1991 වසරේ සිට 2009/2010 වසර දක්වා සිංහල සංස්කෘතික හමුවෙහි සේවය කරන ලද සභාපතිවරුන්
සංස්කෘතික හමුවෙහි 1990/1991 වසරේ සිට 2009/2010 වසර දක්වා සභාපතිවරුන් ලෙස පිළිවෙලින් සෝමරත්න දිසානායක, වෛද්‍ය බණ්ඩාර සෙනෙවිරත්න, සනී ජයතිලක, ශාන්තිලාල් කොරතොට, සෝමරත්න දිසානායක, උබයසිරි විජයනන්ද වික්‍රම, අනුර ජයවර්ධන, නිහාල් ප්‍රනාන්දු, සරත් කුමාර, ආචාර්ය අතුල ගිණිගේ, ආචාර්ය ලක්‍ෂමන් රන්දෙනිය, අතුල අමරසිංහ, මහින්ද කරුණාරත්න, උදය ද සිල්වා, සාමප්‍රිය සුමනසේකර, සමන් දිසානායක යන මහත්වරුන් සේවය කර ඇත. සමාරම්භක නිලධාරී මණ්ඩලය ඇතුළුව මෙම දශක දෙකක කාල සීමාව තුළ සිංහල සංස්කෘතික හමුවෙහි කමිටුවල සේවය කරන ලද සියළු නිලධාරීන් සංඛ්‍යාත්මකව ගත් කළ ආසන්න වශයෙන් 375 ක් පමණ වෙති. සෑම වසරකම තේරී පත්වන කමිටුවල නිලධාරීන්ට ඔවුන් සමඟ වෙහෙස මහන්සි වෙමින් දිවා රෑ නොබලා වැඩ කරන සහෘද පිරිසකගේ සහායට අමතරව සිංහල සංස්කෘතික හමුවෙහි පුළුල්

42 වන පිටට

